*සංගීතඥ රෝහණ ධර්මකීර්ති වරක් ඔහු අපට හඳුන්වා දුන්නේ "අපේ සින්දු කියන දොස්තර මහත්තයා" ලෙසිනි. "වේදිකාවෙත් පැදුරෙත් එක වගේ සින්දු කියන හොඳ මනුස්සයෙක්."*



*ශ්‍රී ලංකාවේ රෝහල් සඳහා ඇඳන් සහ උපකරණ පරිත්‍යාග කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු සඳහා මෙල්බන් පුරවරයට පැමිණි වෛද්‍ය ආනන්ද ගුණසේකර නම් වන රසවතා සමග ගතකළ සොඳුරු සැඳෑවක කළ කතා බහ ඇසුරින් මේ ලිපිය සැකසෙයි. හදවතට දැනෙන ලෙස ගී ගයන ආනන්ද සමඟ ගෙවූ සැන්දෑව රසවත් කළ රවි කුමාරසිංහ සොයුරාටත් සංවිධානය කළ රෝහණ ජයසේකර සොයුරාටත් අපේ ස්තූතිය.*

# නිසි කළමණාකරණය අපේ සාර්ථකත්වයේ රහසයි



## වෛද්‍ය ආනන්ද ගුණසේකර

අධ්‍යක්ෂ ශික්ෂණ රෝහල කුරුණෑගල

### විදෙස් ගත

බොහෝ ශ්‍රී ලාංකිකයෝ තවමත් සිතින් මව්බිම හා රැඳී සිටිති මව්බිමේ සහෝදර ජනතාව ගේ සුබසිද්ධිය උදෙසා නොයෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නටද ඔවුහු පෙරමුණ ගනිති. මේ සමහර ව්‍යාපෘති අති විශාල ප්‍රචාරයන් සහිතව දියත් වෙයි. වැඩි ඝෝෂාවකින් තොරව ක්‍රියාත්මක වන වැදගත් ව්‍යාපෘතියක් පිළිබඳ සංවාදයක යෙදෙන්නට කුරුණෑගල ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ආනන්ද ගුණසේකර මහතා පසුගිය දිනෙක සන්නස සමග එක්විය.

ශ්‍රී ලංකාවේ රෝහල් සඳහා ඇඳන් සැපයීමේ ව්‍යාපෘතිය ආරම්භ කෙරුණේ මෙයට වසර දෙකකට පමණ පෙර දී ය මෙල්බන් සිංහ සමාජයත් වීලර්ස් හිල් හි සවුත් ඊස්ට් බිස්නස් සමාජයත් එක්ව ක්‍රියාත්මක කෙරුණ මේ වැදගත් ව්‍යාපෘතිය නිසි ලෙස සම්බන්ධීකරණය කර නිසි ඵල නෙලා ගන්නට ශ්‍රී ලංකාවි අදාල පාර්ශවයන් අසමත් විය.



"විවිධ හේතූ තිබුණා. . . ප්‍රධානම දුර්වලතාවය වෙලා තිබුණේ නිසි සම්බන්ධීකරණයක් නොතිබීමයි. . ." ආනන්ද කියයි.

වෛද්‍ය ආනන්ද ගුණසේකර මේ ව්‍යාපෘතියට පිවිසෙන්නේ මෙවන් පසුබිමක දී ය. මෙල්බන් හි ප්‍රසිද්ධ ව්‍යාපාරික දයා ප්‍රනාන්දු හා අයිවන් අල්මේදා යන මහත්වරුනට ආනන්ද මේ සත් කාර්යයට සම්බන්ධ කර ගැනීමේ ගෞරවය හිමිවෙයි. එය සිදුවන්නේ වර්ෂ 2005 දී ය.

"එක පාරටම මේ වැඩේට අතගහන්න මම හිතුවෙ නැහැ. . මං ඉස්සෙල්ලාම පසුගිය කාලයේ මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණ ආකාරය අධ්‍යයනය කළා. අඩුපාඩු වුණ තැන් තේරුම් ගත්තා. ." රෝහල් ඇඳන් ව්‍යාපෘතියට තමා සම්බන්ධ වූ ආකාරය ආනන්ද සිහිපත් කරන්නේ එසේ ය. "මම මුලින්ම මේ සඳහා අපේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතිය ලබා ගත්තා. මට තේරුම් ගියා මෙවන් ව්‍යාපෘතියකින් නිසි ඵල නෙලා ගන්න නම් ඉතා පැහැදිළි වැඩ පිළිවෙලක් සකස් කර තිබිය යුතු බව. ව්‍යාපෘතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හදන්න මම හුඟක් වෙහෙසුණා. මේ අරමුණ ඇතිව ආනන්ද අනතුරුව මුණ ගැසුණේ භාණ්ඩාගාර ලේකම්වරයාව ය. ආන්නදගේ පැහැදිළි කරුණු දැක්වීම මත රෝහල් ඇඳන් ව්‍යාපෘතිය වෙනුවෙන් විශේෂ බදු සහනයක් ලබා දෙන්නට ලේකම්වරයා එකඟ විය.

"ඒ කඩුල්ල පැන්නට පස්සෙ මට හිතට ලොකු සහනයක් ලැබුණා. . දැන් තියෙන්නෙ මගේ පැත්තෙන් කළ යුතු වැඩ. මම පළමුව ව්‍යාපෘතිය බාරව කටයුතු කරන්න පරිපාලන නිලධාරියෙකු පත් කළා. ඔහුට ලිපි කරුවන් දෙනෙකුත් දුන්නා. අපට ලැබෙන සියලුම භාණ්ඩ වලට වගකියන්න ඔහු බැඳී සිටිනවා. . සෑම භාණ්ඩයක්ම ලේඛණ ගත කර නිසි ලෙස රෝහල් වලට බෙදා දීම ඔහුගේ වගකීම. අපට ලැබෙන සියලුම ඇඳන් කෙළින්ම රෝහල් වලට නිකුත් කරන්න මම හිතුවෙ නැහැ. පළමුව ඒ ඇඳන් වල තිබෙන සුලු සුලු අඩුපාඩු සම්පූර්ණ කළ යුතු වෙනවා. තීන්ත ටිකක් ආලේප කරන එකත් වැදගත්. මොකද මේ විදිහට ලස්සනට ඇඳක් දුන්නහම තමයි ඒවා ලබාගන්න අයත් සතුටු වෙන්නෙ. ඒක ඇඳන් පරි,යාග කළ අයටත් සතුටට කාරණයක් වෙනවා."

මේ ව්‍යාපාතීය යටතේ මේ වන විට රෝහල් ඇඳන් 325 ක් පරිත්‍යාග කෙරී ඇත. ඒවාට අමතරව ඇස් වල දෘෂ්ඨි විතානයේ හල්‍යනර්ම කිරීමට යොදා ගන්නා ඩොලර් ලක්ෂයක් පමණ වටිනා Vitrectomy යන්ත්‍රයක් ද ඇසේ සුද ඉවත්කිරීමේ ශල්‍යකර්ම වලට යොදා ගන්නා ඩොලර් 50000 ක් පමණ වටිනා යන්ත්‍රයක් ද මේ වන විට පරිත්‍යාග කර ඇත.

"දැනටමත් බොහෝ සංවිධාන සහ පුද්ගලයන් අපට තවත් ආධාර කරන්න ඉදිරිපත් වෙලා තියෙනවා. ." ආනන්ද වැඩි දුරටත් විස්තර කළේ ය. පසුගිය කාලයේ ඔස්ට්‍රේලියා ශ්‍රී ලංකා බිස්නස් කවුන්සිල් හි පුෂ්පා හෙට්ටිආ රච්චි මහත්මිය හමුවීමත් වැදගත්. අපට ඇය හඳුනාගන්නට ලැබුණේ අපේ හිතවත් රෝහණ ජයසේකර මාර්ගයෙන්. ඇයත් අගේ හිතවත් පිරිසත් අපට විශාල සහයක් දෙනවා.

අපට ලැබෙන සියලුම උපකරණ නියම ආකාරයෙන් පොත් පත් වල සටහන් වෙනවා. ඒ නිසා කිසිම ආකාරයට වංචාවක් වරදක් අනිසි පරිහරණයක් සිදු නොවන බවට වගකීමක් තියෙනවා. අපට මේ ද්‍රව්‍ය පරිත්‍යාග කරන අයට එය විශාල සහනයක්." ආනන්ද විස්තර කරයි. ". . ඔබ හිතනවා ඇති මේ සියලුම ආධාර අපි කුරුණෑගල රෝහල ට පමණක් යොදා ගන්නවා කියලා. එහෙම නැහැ. අපි දැනටමත් වෙනත් රෝහල් ගණනාවකටම ඇඳන් යවා තියෙනවා. අපේ අරමුණ කුඩා රෝහල් වැඩි දියුණු කිරීම මගින් මූලික රෝහල් වල තදබදය අඩුකිරීමයි. ඒ වෙනුවෙන් අපි දැනටමත් පියවර රැසක් අරගෙන තියෙනවා."

වෛද්‍ය ආන්නද ගුණසේකර යටතේ තිබෙන වයඹ පළාතේ පමණක් දිසා රෝහල් 17 ක් ඇත . මූලික රෝහල් 4 කි. ලැබෙන ඇඳන් සහ වෙනත් ආධාර මේ රෝහල් වලට බෙදා දීම මගින් රෝගීන්ට ඒ ඒ ප්‍රදේශවලදීම වෛද්‍ය සේවා බලාගන්න හැකි වෙනවා පමණක් නොව ඒ නිසාම වඩාත් විශේෂඥ සේවා ලබා දෙන මූලික සහ ශික්ෂණ රෝහල් වල තදබදයද අඩුවෙයි.

"මේ ව්‍යාපෘතියට ආධාර කරන කිසිම කෙනෙකුට කිසිම ආකාරයක බයක් ඇතිකරගන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. සියලුම ආධාර නිසි කළමණාකරණයක් යටතේ නිසි ආකාරයට රෝහල් වලට බෙදාහැරෙන බවට අපි සහතික වෙනවා. ඒ වගකීමේ සහතිකය අපි ඔබට දෙනවා.." ආනන්ද අවසන් වශයෙන් පැවසුවේ ය.

**සංවාද සටහන - ජගත් ජේ එදිරිසිංහ**





THE KINGDOM OF RAIGAM®
21 වන සියවසේ දේශීය සමාගම
www.raigam.lk
Sri Lanka
Raigam
රයිගම් නම් කවදත් කොතැනත් හරිම රසයි!
දැන් අළුත් රස රැසක්!
Try New Fried & Devel Cuttle Fish Soy TVP and New String Hopper Flour
(now you don't have to use boiling or hot water to make string hopper mix/dough! ඇල් වතුරෙන් අනන්න!)
Raigam – Premium Quality Food Manufacturers from Sri Lanka.
Raigam – A trusted brand for taste and uncompromised quality.
Raigam Soy, Noodle Meal Kits, Vinegar, String Hopper Rice Flour, Dehydrated Vegetables, Coffee, Spices & Raigam Biscuits.
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, Essendon, Victoria
Tel:03-9370 3813 Fax orders: 03-9337 9468
Email:sales@etechno.com.au
July 2006